# දක්ෂිණ ශ්‍රී ලංකාවේ සෙල්ලිපිවලින් හෙළිවන ආර්ථික තොරතුරු පිළිබඳ විමර්ශනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ සෙල්ලිපි ඇසුරින්)

එච්.එන්. චාමර*

හෙළ වංශ කතාව තරමට ම පෞරාණික ඉතිහාසයකට උරුමකම් කියනා දක්ෂිණ දේශයේ අභිලේඛන තුළ හම්බන්තොට දිස්ත්‍රික්කය වැදගත් වන්නේ ආර්ථික, දේශපාලන හා ඓතිහාසික වශයෙන් වැදගත් වන්නා වූ සෙල්ලිපි රැසක් හම්බන්තොට ආශ්‍රිතව පිහිටා තිබීම හේතුවෙනි. ක්‍රි. පූ. 2 වන සියවස සිට ක්‍රි. ව. 13 සියවසේ මැද භාගය දක්වා වූ කාලය තුළ මෙරට වූ ආර්ථික තත්වය පිළිබඳව හඳුනා ගැනීමේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ සෙල්ලිපි වලින් නොදෙවෙනි දායකත්වයක් සපයා දෙයි. දක්ෂිණ ශ්‍රී ලංකාවේ සෙල්ලිපිවලින් හෙළිවන ආර්ථික තොරතුරු පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සෙල්ලිපි ඇසුරින් විධිමත්ව සිදු කර නොතිබීම මෙම අධ්‍යයනයේ ගැටලුවයි. ශිලා ලේඛනවලින් විද්‍යමාන වන හම්බන්තොට දිස්ත්‍රික්කයේ අර්ථක්‍රමයන් පිළිබඳ මූලික අධ්‍යයනයක් සඳහා අවධානය යොමු කෙරෙන මෙම අධ්‍යනයේ මූලාශ්‍රය ලෙස ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර යොදා ගැනෙයි. ප්‍රාථමික මූලාශ්‍රයවල කරුණු සනාථ කර ගැනීම සඳහා ද්විතියික මූලාශ්‍රයවල කරුණු සහ ඒ හා සම්බන්ධව අදහස් ඉදිරිපත් කරන විද්වතුන්ගේ මතවාදයන් ද යොදා ගැනෙයි. මෙහිදී දකුණු ලක සෙල්ලිපිවලින් හෙළි වන අර්ථ විධි යටතේ වාරි කර්මාන්තය, සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය, වෙළදාම, වෙළඳුන් හා වෙළඳ ශ්‍රේණි, කිරීම් හා මැනීම්, බැංකු ක්‍රමය, මුදල් භාවිතය හා වරාය ආදී ක්ෂේත්‍ර විෂයයෙහි බොහෝ තොරතුරු ශිලා ලේඛනවලින් හෙළිවන අයුරු අධ්‍යයනය කිරීමත් පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස හඳුන්වා දීමට හැක. හම්බන්තොට ප්‍රදේශයේ ආර්ථික තොරතුරු විෂයෙහි ඓතිහාසික පර්යේෂණයන්හි නියැලෙනා සහ නියැලීමට සිටිනා වත්මන් හා අනාගත ප්‍රජාවගේ පර්යේෂණ පහසුව ද මෙමගින් බලාපොරොත්තු වෙයි.

ප්‍රමුඛ පද – දක්ෂිණ ශ්‍රී ලංකාව, සෙල්ලිපි, ආර්ථික තොරතුරු, හම්බන්තොට දිස්ත්‍රික්කය, අර්ථ ක්‍රමය

* සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය chamaranuwan65@gmail.com